# පුරාභෙද සූත්‍ර 3
## Before the Break-up of the Body part 3

My immense gratitude to the great Noble council of Akanitta brahma realm

14/01/2014

හළ ගිජුකම ඇත්තේ, මසුරු නැත්තේ,  මුනිතෙම උසස් යැයි නොකියයි.
සම යැයි නොකියයි. පහත් යැයි නොකියයි. කල්ප රහිත වූයේ කල්පනයට නොපැමිණේ.

**වීතගෙධො අමච්ඡරී, න උස්සෙසු වදතෙ මුනි;**
**න සමෙසු න ඔමෙසු, කප්පං නෙති අකප්පියො.**

## හළ ගිජුකම ඇත්තේ මසුරු නැත්තේ - **වීතගෙධො අමච්ඡරී**

- ගෙධයයි තෘෂ්ණාවට කියයි: තෘෂ්ණාව මුලින් සිඳුනේද,  ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම හළ ගිජුකම ඇත්තේ යැයි කියයි. හෙතෙම රූපයෙහි, ශබ්දයෙහි, ගන්ධයෙහි රසයෙහි ස්පර්ශයෙහි නො ගිජු යැ.
- මසුරුකම – මච්ඡරිය – මසුරුකම් පසෙකි. - ආවාස මසුරුකම (ආවාසමච්ඡරිය), කුල මසුරුකම (කුලමච්ඡරිය), ලාභ මසුරුකම (ලාභමච්ඡරිය), වර්ණ මසුරුකම (වණ්ණමච්ඡරිය), ධර්ම මසුරුකම (ධම්මමච්ඡරිය). යමෙකුට මේ මසුරුකම ප්‍රහීණද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද, හෙතෙම නොමසුරු තැනැත්තේ යැයි  කියයි.


## මුනිතෙම උසස් යැයි නොකියයි. සම යැයි නොකියයි. පහත් යැයි නොකියයි -  **න උස්සෙසු වදතෙ මුනි; න  සමෙසු න ඔමෙසු**
## කල්ප රහිත වූයේ කල්පනයට නොපැමිණේ  - **කප්පං නෙති අකප්පියො**

- **කප්ප** – තෘෂ්ණාකල්ප යැ දිට්ඨිකල්ප යැයි කල්පනයෝ දෙදෙනෙකි. සංකල්පයෙන් (ඉහත උසස් යැයි... පහත් යැයි සංකල්ප) පසුව වන ප්‍රතිඵලය කල්පනයෝ යැ.
- තෘෂ්ණාකල්පය ප්‍රහීණ හෙයින්  දිට්ඨිකල්පය දුරින්ම දුරු කළ බැවින් තෘෂ්ණාකල්පය හෝ දිට්ඨිකල්පය  නූපදවයි.


**තෘෂ්ණා සහ මසුරුකම – මේවායින් කුමක් පළමුව සිදුවේද?**

- තෘෂ්ණාව පළමුව බව වැටහේ.

1. තෘෂ්ණාව යනු වේදනාවට සංඥාව මගින් අගයක් දීම යැ. මෙය වන්නේ සුභයට නිත්‍ය යැයි පැනවීමෙන් අනතුරුවය.



රූප සටහන 1





රූප සටහන 2

2. ලාභ මසුරුකම ඇති වන්නේ 6. දිට්ඨානුසය වීමෙන් අනතුරුවය. දැන් මේ අනුව ගැලපීම කරයි. a) මෙම ලාභය අන් අයට නැත. මෙසේ උසස් යැයි මානය ඇතිවේ. b) සමහර අයට ඇත – සමාන යැයි මාන වේ. c) සමහර අයට මට වැඩියෙන් ඇත – පහත් යැයි මාන ඇතිවේ.

3. මෙම සංකල්පයන්ට අනුව තෘෂ්ණාකල්ප සහ දිට්ඨිකල්ප (කප්ප) ඇතිවේ.

- තෘෂ්ණාකල්ප – රූප සටහන 1.
- දිට්ඨිකල්ප – රූප සටහන 2 – අත්තා යැයි ගත් නිසා




මෙය වටහා ගැනීමෙන් නිරෝධ සමාපත්තිය ඇතිවේ.
කුමක් නිසාද?

- පුරාභෙද සූත්‍ර 2 - පිටුව 8 බලන්න.
- තණ්හාව (පථය B) නැති නිසා පථය C කැපීම සිදුවේ.
- අත්තා යන දිට්ඨිය නැති නිසා පථය A කැපීම සිදුවේ.

ලොවැ යම් ක්ෂීණාශ්‍රවයක් හට මාගේ යැයි ගන්නාලද දෙයක් නැත්ද, නැති බැවින් ශෝක නොකරයි. සියලු ධර්මයන්හි ඡන්ද ආදි වශයෙන් අගතියට නොයේද, හෙතෙම ඒකාන්තයෙන් ශාන්තවූයේ යැයි කියයි.

යස්ස ලොකෙ සකං නත්ථි, අසතා ච න සොචති;
ධම්මෙසු ච න ගච්ඡති, ස වෙ සන්තොති වුච්චති

ලොවැ යම් ක්ෂීණාශ්‍රවයක් හට මාගේ යැයි ගන්නා ලද දෙයක් නැත්ද - යස්ස ලොකෙ සකං නත්ථි

- යස්ස යනු අර්හත් ක්ෂීණාශ්‍රවයන් වහන්සේට. ක්ෂීණාශ්‍රවයක් හට මෙය මාගේය කියා හෝ මෙය අනුන්ගේය කියා හෝ කිසි රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ වශයෙන් ගන්නා ලද්දක් පරාමර්ශ කිරීමක් අභිනිවෙශ කිරීමක් නැත. එම සියල්ල ඥානය නමැති ගින්නෙන් දැවුනේය.
- මෙයින් අලෝභ කුසල මූලය දක්වයි.
- රූප  වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාන මාගේය කියා නොගැනීම නිසා විපරිනාම දුක්ඛතාවයට නොයයි.

නැති බැවින් ශොක නොකරයි - අසතා ච න සොචති.

- වෙනස් වෙන වස්තුවෙහිද ශොක නොකරයි. වෙනස්වූ කල්හි ද ශොක නොකරයි. මාගේ ඇස කණ, නාසය, දිව, කය වෙනස් වූයේ යැයි ශෝක නොකරයි. ක්ලාන්ත නොවෙයි. නොහඬයි. පපුවේ අත් ගසමින් නොහඬයි. සිහි මුලාවට නොපැමිණෙයි.
- මෙයින් අදෝශ කුසල මූලය දක්වයි.
- රූප  වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාන වෙනස්වූ කල්හි ශෝක නොකරන නිසා දුක්ඛ දුක්ඛතාවයට නොයයි.

සියලු ධර්මයන්හි ඡන්ද ආදි වශයෙන් අගතියට නොයේද -ධම්මෙසු ච න ගච්ඡති

a) ඡන්දයෙන් අගතියට නොයයි - න ඡන්දාගතිං ගච්ඡති
b) ද්වෙෂයෙන් අගතියට නොයයි - න දොසාගතිං ගච්ඡති
c) භයෙන් අගතියට නොයයි - න භයාගතිං ගච්ඡති
ා) මෝහයෙන් අගතියට නොයයි - න මොහාගතිං ගච්ඡති

- මෙයින් අමෝහ කුසල මූලය දක්වයි.
- සංස්කාර දුක්ඛතාවයට යටත් නොවේ.


හෙතෙම ඒකාන්තයෙන් ශාන්තවූයේ යැයි කියයි - ස වෙ සන්තොති වුච්චති


- හෙතෙම ශාන්තවූයේ උප ශාන්තවූයේ සංසිඳුනේ නිවුනේ සංසිඳුනේ යැයි කියයි.

සතර අගති ගමන් නොයෑම සඳහා; එනම් i) ඡන්දයෙන් අගතියට නොයෑම, ii) ද්වේෂයෙන් අගතියට නොයෑම  iii) භයෙන් අගතියට නොයෑම iv) මෝහයෙන් අගතියට නොයෑම සඳහා මෙත්තා, කරුණා, මුදිතා සහ උපෙක්ඛා අප්‍රමාණයෝ භාවිත කළ යුතුය.

## උපෙක්ඛා අප්‍රමාණයට පැමිණි විට කුමක් සිදුවේද?

- මෙය වටහා ගැනීම සඳහා ලෝභ, ද්වේෂ සහ මෝහ භාවනාව කරන්න.
- මනාප අරමුණ –> සුඛ ස්පර්ශය -> සුඛ වේදනාව-> සොම්නස් සිතිවිලි. මේ වන විට සංකල්ප සාදා ඇති අතර රාගය ඇත.
- පියවර වල් හතක් ගොස් 7. නන්දිය දක්වා පැමිණ ඇත. දිට්ඨානුසය හරහා රූපයට සුඛ යැයි පවරා ඇත. මෙවිට රාගයෙන් දැවීම -> විපරිනාම දුක්ඛතාවය. ඉන් අනතුරුව ද්වේෂ පාර සහ ඉන් අනතුරුව මෝහ පාර.
- අවසාන ප්‍රතිපඵලය වන්නේ සංස්කාර දුක්ඛතාවය වේ.






- උපෙක්ඛා අප්‍රමාණය නැතිනම් රූපය ලාභ වශයෙන් ගනී.
- ලාභය –> සාධෙය්‍ය. ලාභය හා සම්බන්ධ ධර්මයෝද මගේ යැයි ගනී.
- මේ නිසා, අවිද්‍යාව -> මෝහයෙන් අගතියට යෑම -> සංස්කාර -> භයෙන් අගතියට යෑම -> පථය A -> පථය B -> චේතනා
- මෙසේ චේතනා වීමෙන් තමා (අත්තා) විය.
- මෙ මගින් සැදෙන්නේ භවයයි.